# E-Operations විද්‍යුත් මෙහෙයුම්

විද්‍යුත් මෙහෙයුම් යනු ඔබගේ සංචාරක කර්මාන්ත ක්‍රියා සැලසුමේ ප්‍රධාන කොටසකි. මෙය ඩිජිටල් යුගයේ සංචාරක කර්මාන්ත කළමණාකරණය සඳහා වන චක්‍රීය පුනරාවර්තී ක්‍රියාවලියක් වේ. විද්‍යුත් සංචාරක කර්මාන්තය පාඨමාලාවේ දී අප දැනටමත් සාකච්ඡා කර ඇති ආකාරයට හෝටල් හා තානායම් මෙහෙයුම් කළමණාකරුවන් එම ස්ථාන වල දිනපතා සිදුවන මෙහෙයුම් භාරව සිටී. සුමට මෙහෙයුම් තුළින් උපරිම ලාභ ලැබීම සඳහා සාර්ථකව ගෘහ පාලනය ආහාරපාන පිළිගැන්වීම් ඇතුළු ඉදිරිපස කටයුතු මැනවින් අධීක්ෂණය කිරීම ඔවුන් සතු වගකීම වේ.

මෙම සාම්ප්‍රදායික මෙහෙයුම් තනතුරු තවදුරටත් පවතින නමුත් විද්‍යුත් මෙහෙයුම් කටයුතු වලදී කාර්යක්ෂමතාව, නිවැරදිභාවය පවත්වාගෙන යාම සඳහා ඩිජිටල් මෙවලම් භාවිතා කරයි. එමඟින්  වියදම් අඩුකර සේවා වෙන් කිරීම් පාරිභෝගික බිල්පත් ගිණුම්කරණය සහ මුදල් ගෙවීම් නිසි ලෙස කළමණාකරණය කිරීම මඟින් ලාභ වැඩි කිරීම මෙහි අරමුණ වේ.

විද්‍යුත් මෙහෙයුම් පද්ධතියට,

- වෙන් කිරීම් කළමණාකරණය
- දේපල කළමණාකරණය
- ව්‍යාපාර කළමණාකරණය අන්තර්ගත වේ.

මෙම කාල වකවානුවේ බහුතරයක් ඩිජිටල් විසඳුම් වලට අවම වශයෙන් ඉහත අංග වලින් දෙකක් වත් සම්බන්ධ වේ. සාමාන්‍යයෙන් වෙන් කිරීම් හා දේපල කළමණාකරණය එකම විසඳුම් පැකේජයකට සම්බන්ධ කර ඇත.

## Reservation Management - වෙන් කිරීම් කළමණාකරණය

මෙම පාඩම මඟින්,

සාමාන්‍ය ක්‍රමයට දුරකතන හා ලිපි ලේඛන භාවිතා කර වෙන් කිරීම හා මාර්ගගත ක්‍රමයට වෙන් කිරීම් කරන පද්ධති අතර වෙනස

- මාර්ගගත වෙන් කිරීම් පද්ධති වල වාසි හඳුන්වා දෙනු ලැබේ.

මෙම පාඩම අවසාන වන විට ඔබට,

- වෙන් කිරීම් පද්ධතියක කාර්යයන් සාකච්ඡා කිරීම.
- අතින් සිදුකරන (Manual) සහ මාර්ගගත වෙන් කිරීම් පද්ධති වල වෙනස වටහා ගැනීම.
- ඔබගේ සංචාරක ව්‍යාපාරය විසින් භාවිතා කරන ලද වෙන් කිරීම් පද්ධතිය හඳුනාගැනීම සහ මාර්ගගත පද්ධතියක ශක්‍යතාව තක්සේරු කිරීම.
  යන දෑ සිදු කිරීමට හැකි විය යුතුය.

## Types of Reservation Systems - වෙන් කිරීම් පද්ධති වර්ග

### 01. Manual Reservation

ලිපි ද්‍රව්‍ය භාවිතයෙන් වෙන් කිරීම් කළමණාකරණය.

වෙන් කිරීම් පද්ධතියක මූලිකම වර්ගය වන්නේ ව්‍යාපාර ඔවුන්ගේ ආගන්තුකයන්ගේ කාමර හා සේවා වෙන් කිරීම් හෝටලයට වාර්තා කිරීම් (Check in) සහ මුදල් ගෙවීම් වෙන් කිරීම් සියල්ල කඩදාසි වල ලියා තබා ගැනීමයි.

## Reservation Management in Excel Spread Sheet

## excel පැතුරුම්පත් භාවිතා කර වෙන් කිරීම් කළමණාකරණය කිරීම.

සමහර ව්‍යාපාර පරිගණකය භාවිතයෙන් excel හෝ අනෙකුත් පැතුරුම් පත් භාවිතා කරමින් වෙන් කිරීම් කළමණාකරණය කරයි.

මෙම වෙන්කිරීම් කළමණාකරණය ආකාර දෙකෙහිදීම ව්‍යාපාර වලට කාමර හා සේවා වෙන් කිරීම් අතින් සිදු කිරීම සිදුවේ. මෙම ක්‍රමයේදී ඔවුනට දැනට කාමර වල ආගන්තුකයින් රැඳී සිටින ප්‍රමාණය දැනට ඉතිරිව ඇති හිස් කාමර ප්‍රමාණය මිල ගණන්, මේ වන විට වෙන් කර ඇති කාමර ප්‍රමාණය යන සියළු දත්ත අතින් ඇතුළත් කිරීමට සිදු වේ.

### Online Reservation Systems මාර්ගගත වෙන් කිරීම් පද්ධති.

මාර්ගගත හෝටල් වෙන්කිරීම් පද්ධතියක් යනු ආගන්තුකයින්ට ඉතා පහසුවෙන් ඔවුන්ගේ සංචාරය සැලසුම් කර ගත හැකි මෘදුකාංග මෙවලමකි.

- මෙහි ඔබගේ සියළුම අලෙවි මාධ්‍ය වල ඇති සජීවී මිල ගණන හා තත්‍ය කාලයෙහි පවතින බඩු තොගය යන සියල්ල දිස් වේ.
- මේ ආගන්තුකයන්ට ඔවුන්ගේ සංචාරක දින තෝරා ගැනීමට හා ඔවුන්ගේ වෙන් කිරීම් තහවුරු කිරීමට අවස්ථාව සලසයි.
- වෙන්කිරීමක් සිදුකල වහාම මෙමගින් ස්වයංක්‍රීය වෙන්කිරීමේ විද්‍යුත් පණිවිඩයක් යවනු ලැබේ.
- ආගන්තුකයන්ට ඔවුන්ගේ ගණුදෙනුව සම්පූර්ණ කිරීම සඳහා ගෙවීම ද්වාරයකින් යුක්තය.
- මෙමගින් කාමරයක් වෙන්කරන ලද අවස්ථාවකට ඔබගේ දේපල කළමණාකරණ පද්ධතිය හා මධ්‍යම කළමණාකරණ පද්ධතිය යාවත්කාලීන කරනු ලැබේ.

**The benefit of an online reservation system මාර්ගගත වෙන්කිරීම් පද්ධතියක වාසි.**

- එමගින් ඔබගේ දේපලෙහි රැඳී සිටින අමුත්තන්ගේ අත්දැකීම් ඍජුවම ඉහල දමනු ලබයි.
- Cloud මත පදනම් වුන හෝටල් වෙන් කිරීමේ පද්ධතියක් මගින් ඔබගේ අමුත්තන්ට ලෝකයේ ඕනෑම තැනක සිට ඔවුන් කැමති කාමරය, ඔවුන්ගේ පරිගණකය, ටැබ්ලටය හෝ ජංගම දුරකතනය හරහා වෙන්කළ හැකි වේ.
- ඔබගේ හෝටල් වෙන්කිරීමේ පද්ධතිය කුඩා පෝරමයකින් ආරක්ෂිත ගෙවීම් ද්වාරයකින් සමන්විත වන තරමට ඔබගේ අමුත්තන්ට කාමරයක් වෙන්කිරීම සරල, පහසු සහ සතුටුදායක අත් දැකීමක් වේ.
- මෙය ඔබගේ හෝටලය පිළිබඳව පළමුවන හැඟීම ඇතිකරන මාධ්‍ය වන අතර එය ඔබගේ සන්නාමය පිළිබඳව දරන ආකල්පය පිළිබඳව කල්පවත්නා බලපෑමක් ඇතිකරනු ලබයි.
- ඔබගේ අමුත්තන්ට අදාල ක්‍රියාවලිය සම්පූර්ණ කර ඔබගේ හෝටල් කාමරය මාර්ගගතව වෙන් කිරීමට නම් ඔබගේ මාර්ගගත වෙන් කිරීම් පද්ධතිය ඉතා පරිශීලක, මිත්‍රශීලි ස්වරූපයක් ගත යුතුය.
- මෙමඟින් ඔබට සහ ඔබගේ කාර්යමණ්ඩලයට ඇති පරිපාලන ක්‍රියාවලිය සරල කරනු ලැබේ. e-mail හරහා විමසීම් වලට පිළිතුරු සැපයීම දුරකතන හරහා වෙන් කිරීම් අනුමත කිරීම වෙනුවට මාර්ගගත වෙන් කිරීමේ පද්ධතියක් හරහා අදාල කටයුතු කිරීම ඉතා පහසු වේ.

හෝටල් වෙන්කිරීම් පද්ධතියක් නොමැති අවස්ථා වලදී එක් පුද්ගලයෙකුට සියළුම බෙදාහැරීමේ මාධ්‍ය හරහා වන වෙන්කිරීම් සියල්ලම අතින් ලේඛනගත කිරීමට සිදුවන අතර එය ඉතා අපහසු කාර්යයකි.

හෝටල් වෙන්කිරීමේ පද්ධතියක් තිබෙන අවස්ථා වලදී සජීවී මිල ගණන් හා ලබාගත හැකි කාමර (availability) කොපමණද යන්න මෘදුකාංගය මගින් ස්වයංක්‍රීයව යාවත්කාලීන වේ.

වෙන්කරන ලද කාමරයක් නැවත වෙන්කිරීමේ අවධානම ඉතා අඩු අතර එමඟින් ඔබගේ හෝටල් මෙහෙයුම් කටයුතු වල සුමටභාවය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වේ.

## Summary - සාරාංශය


- කඩදාසි ලිපිගොනු හෝ පැතුරුම්පත් වෙන්කිරීම් භාවිතා කරන විට ව්‍යාපාර වලට වෙන්කිරීම් අතින් ලියාගැනීමට සහ දනට කාමර වල අමුත්තන් ඇති/නැති බව, මිල ගණන් හිස්ව පවතින කාමර ගණන වෙන් කරන ලද කාමර ගණන යන සියල්ල එකිනෙක දත්ත ඇතුළු කිරීමට සිදු වේ.
- මාර්ගගත වෙන්කිරීම් පද්ධතියක් තුලින් අමුත්තන්ට ව්‍යාපාර සමඟ ඍජුවම සම්බන්ධ වීමකින් තොරව සිය සංචාරය සැලසුම් කිරීම, වෙන් කිරීම, ගෙවීම් කිරීම යන සියල්ල පහසුවෙන් සිදුකල හැක.
- මාර්ගගත වෙන්කිරීම් පද්ධති වල වාසි වන්නේ,
  - අමුත්තන්ට වැඩිදියුණු කරන ලද අත්දැකීමක් ලබා දීම.
  - සරල බවට පත්කරන ලද පරිපාලන ක්‍රියාවලිය.
  - වරක් වෙන්කරන ලද කාමරයක් නැවත වෙන්කිරීමේ අවදානම අඩුවීම.


## Property Management System (PMS) - දේපල කළමණාකරණ පද්ධතිය.

මෙම පාඩම මඟින්,

* අතින් සිදුකරන (Manual) ක්‍රියාවලියට එරෙහිව PMS ප්‍රයෝජන
* දේපල කළමණාකරණ පද්ධතියේ ප්‍රධාන කොටස්

පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ.

මෙම පාඩම අවසානයේ දී ඔබට,

* දේපල කළමණාකරණ පද්ධතියෙහි මූලික කාර්යයන් සහ ප්‍රතිලාභ පැහැදිලි කිරීමට.
* Manual පද්ධතියක් සහ මාර්ගගත PMS අතර මූලික වෙනස්කම් පැහැදිලි කිරීමට
* සංචාරක ව්‍යාපාරයක් සඳහා PMS හි ශක්‍යතාවය තක්සේරු කිරීමට

PMS සැපයුම් කරුවකු වන cloudbeds හි ඇතුළත් පහත වීඩියෝ පටය, PMS යනු කුමක්ද? ඔබගේ නවාතැන් පහසුකම් කළමණාකරණය PMS හරහා ස්වයංක්‍රීයව සිදු කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරනු ලැබේ.

## What is a PMS?

PMS යනු කුමක්ද?

පසුගිය වසර කීපය තුළ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය ඉතා ප්‍රබල ලෙස වෙනස් වී ඇත. අන්තර්ජාලය ස්මාර්ට් ජංගම දුරකතන, ආකර්ශනීය ගමනාන්ත වලට ඉක්මනින් සම්බන්ධ වීමේ හැකියාව, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් වැනි තාක්ෂණයෙහි දියුණුව සමඟ නවාතැන් පහසුකම් වෙන් කිරීම් වලින් බහුතරයක් දේශීය නියෝජිතයින් (OTAS) (Online Travel Agents) සහ හෝටලයට හෝ නවාතැන්පලෙහි වෙබ් අඩවි වලට සෘජුවම ලැබෙන වෙන් කිරීම් බවට හැරවී ඇත.

දේපල කළමණාකරණ පද්ධතියක් (PMS) යනු මෙම නවාතැන් පහසුකම් සපයන ව්‍යාපාර වලට ඔවුන්ගේ දිනපතා මෙහෙයුම් කාර්යක්ෂමව සැලසුම් කර ගැනීමට සංවිධානයට සහ කළමණාකරණයට උපකාරී වන පරිගණක මෘදුකාංගයකි.

හෝටල් PMS මඟින් ඉතා දිගු කාලයක් වැය කරමින්, අතින් කඩදාසි හෝ පැතුරුම් පත් වල සිදු කරන ලද වෙන් කිරීම් පිළිබඳ දත්ත ඇතුලත් කිරීම, ඉන්වොයිස් සකස් කිරීම යන කටයුතු ඉතා පහසුවෙන් සිදු කළ හැකි බවට පත්කර ඇත.

මෙමඟින් කාමර හා සේවා වෙන් කිරීම් අමුත්තන්ගේ පැමිණීම් හා පිටවයාම් අමුත්තන්ට ගැලපෙන කාමර වෙන් කිරීම් ගෘහ පාලන කටයුතු අදාල සේවකයන්ට යොමු කිරීම් බිල්පත් නිකුත් කිරීම් වැනි සියළුම කටයුතු වල කාර්යක්ෂමතාවය සක්‍රීය කරනු ලැබේ.

PMS මඟින් මෙහෙයුම් විධිමත් හා ස්වයංක්‍රීය බවට පත් කරන අතර මිනිස් පැය ගණන ඉතිරි කිරීම සහ අමුත්තන්ට වඩාත් හොඳින් සේවය සැපයීම සිදුකරයි.

## Overview of Key Features ප්‍රධාන ලක්ෂණ පිළිබඳ දළ විශ්ලේෂණය

ඔබට නිසි අයුරින් තෝරා ගැනීම සඳහා PMS පද්ධති ඉතා විශාල ප්‍රමාණයක් තිබේ. පහත දැක්වෙන්නේ ඒවා සියල්ලේ අඩංගු වන මූලික ලක්ෂණ වේ.

### Reservation - වෙන් කිරීම්

වෙන් කිරීම් පද්ධතිය සියළුම නාලිකා සමඟ ඒකාබද්ධ වන අතර පාරිභෝගිකයින්ට කාමර වෙන් කිරීමේ හැකියාවද ඔවුන්ට යාවත්කාලීන කරන ලද හිස් කාමර පිළිබඳව ද තොරතුරු සපයනු ලබයි.

### Calendar - දින දර්ශනය

දින දර්ශනය වෙන් කිරීම් දෘශ්‍යකරණය කිරීමට ඉතා වටිනා මාධ්‍යයක් වේ. පහසුවෙන් කියවීමට හැකි දින දර්ශනයක් මාර්ගයෙන් ඔබට පැහැදිළිව හිස් කාමර පිළිබඳ තොරතුරු හා වෙන් කිරීම් පිළිබඳ තොරතුරු දැනගත හැක.

### Customer Data - පාරිභෝගික දත්ත

PMS පද්ධතියට පාරිභෝගික දත්ත කළමණාකරණය කිරීමේ කාර්යය ඇතුලත් අතර එමගින් කාර්යය මණ්ඩලයට පාරිභෝගිකයින් සම්බන්ධ කර ගැනීමේ තොරතුරු ලබා ගැනීමට, ඔවුන් හෝටලයේ නැවතුන දින දැනගැනීමට ඒ ඒ අමුත්තාට අදාල කාමරය කුමක්ද දැනගැනීමට ආදී දෑ පහසුවෙන් සිදු කිරීමට හැකියාව සලසයි.

### Rate Plan Management - ගාස්තු සැලසුම් කළමණාකරණය.

ගාස්තු සැලසුම් කළමණාකරණය යන අංගය විසින් ඔබගේ විකුණුම් නාලිකා වල ක්‍රියාකාරීත්ව ඉල්ලුම දැනට ලැඟුම් ගෙන සිටින ප්‍රමාණය, ප්‍රතිවාදීන්ගේ මිල නියම කිරීම්, ඍතු යන සියල්ල පිළිබඳ සලකා බලා නිවැරදි කාමර ගාස්තු නිර්දේශ කරයි.

## Reporting - වාර්තා කිරීම

ස්වයංක්‍රීය වාර්තා වල ක්‍රියාකාරීත්වය විසින් කාර්යය මණ්ඩලයට හෝටලයේ කාර්යය සාධනය, මූල්‍යමය තොරතුරු හෝටල් කළමණාකරණ කාර්යයන් හා ක්‍රියාවලි ඇතුළු නවතම දත්ත ඇතුලත් වාර්තා වලට ඉක්මනින්ම පිවිසීමට හැකියාව ලබා දෙයි.

## Shared Inventory - හවුල් බඩු තොගය

බඩු තොගය (Inventory) යාවත්කාලීන කරන නාලිකා කළමණාකරුවෙකුට සම්බන්ධ වීම. (ලබා ගත හැකි කාමර)

PMS එකක් මඟින් Airbnb, Booking.Com හෝටලයේ වෙබ් අඩවිය වැනි බහු නාලිකා හරහා කාමර ලබාගත හැකි බව තහවුරු කරන අතර මෙම ලබා ගත හැකි කාමර පිළිබඳ තොරතුරු සැම විටම යාවත්කාලීන කරන ලද ඒවාය. සමහර PMS පද්ධති වලට ඔවුන්ගේම සෘජු නාලිකා කළමණාකරණ ක්‍රියාකාරිත්වයක් ඇතුලත් අතර අනෙකුත් නාලිකා වලට බාහිර නාලිකා කළමණාකරුවන් සමඟ ඒකාබද්ධ වීමට සිදු වේ.

## Direct Booking - සෘජුවම කෙරෙන වෙන් කිරීම්

මාර්ගගත වෙන් කිරීම් වලට අමතරව ඊමේල් හෝ දුරකතනය හරහා සෘජුව කරන ලද වෙන් කිරීම් හැසිරවීමටද PMSට හැකියාව තිබිය යුතුය. මෙම වෙන් කිරීම් පද්ධතියට ඇතුලත් කරන අතර එවිට දැනට ලබා ගත හැකි කාමරවල ඉන්වෙන්ට්‍රිය ස්වයංක්‍රීයව සෑම මාධ්‍යයකම යාවත්කාලීන වේ.

## Point of Sale Services විකුණුම් ලක්ෂ්‍යය සේවා

නවීන හෝටල් වල අමතර පහසුකම් සේවා සහ විකුණුම් මධ්‍යස්ථාන රාශියක්ම ඇති අතර ඒවායේ සිදුවන විවිධ ගණුදෙනු නිතරම අමුත්තන්ගේ බිල්පත් වලට එකතු කළ යුතු වේ. අමුත්තන් පිටව යන විට මෙම බිල්පත් ඔවුන්ට ඉදිරිපත් කරන අතර උදාහරණයක් ලෙස අවන්හලේදී පරිභෝජනය කරන ලද ආහාර, නවාතැන් බිල්පතට එකතුවිය යුතු අතර එවිට අමුත්තා පිටත්ව යන විට සියළුම මුදල් එකවර ගෙවිය හැක.

## Invoice & Payment Options ඉන්වොයිස් සහ ගෙවීම් විකල්ප

PMS මඟින් ගෙවීම් විකල්ප රාශියක් ලබා දෙන අතර මාර්ගගත වෙන් කිරීම් සඳහා මුදලින් ගෙවීම, ණයපත් හා මාර්ගගත ගෙවීම් මෙයට ඇතුළත් වේ. මෙමඟින් පාරිභෝගිකයාට ඉන්වොයිසි හා ලදුපත් සාදන අතර ඒවා පහසුවෙන්ම අමුත්තන් පිටවී යන විට නිකුත් කළ හැක.

තවත් PMS පද්ධතියක් වන Hoteliers.guru ඔවුන් විසින් ලබාදෙන PMS විස්තර කරන අයුරු සලකා බලමු.

## PMS+ Channel Manager

## PMS හා නාලිකා කළමණාකරු

PMS හා වෙන්කිරීම් නාලිකා අතර සිදුවන ද්විමාර්ග ඒකාබද්ධ කිරීම් තුළින් කාලය සහ මුදල් සුරකින්නේ කෙසේද?

නාලිකා කළමණාකරුවකු විසින් ඔබ තෝරා ගන්නා Airbnb, booking.com සහ අගොඩා (Agoda) වැනි මාර්ගගත සංචාරක ඒජන්තවරු (OTA) සහ ඔබගේ PMS අතර සබඳතාවයක් ගොඩනගනු ලබයි.

අනතුරුව මෙම ද්විමාර්ග සබඳතාවය හරහා මෙම මාර්ගගත වෙන් කිරීමේ වෙබ් අඩවි වලින් එකක් හරහා නවාතැනක් වෙන් කරන ලද වහාම හෝටලයේ PMS එක ස්වයංක්‍රීයව යාවත්කාලීන වන අතර, එම තොරතුරු එසැනින්ම මෙම "ද්විමාර්ග" සබඳතාවය හරහා හෝටලයත් මාර්ගගත සංචාරක ඒජන්තවරුනුත් අතර හුවමාරු කරගනු ලැබේ. මෙම නිසා අතින් එකින් එක වෙන් කිරීම් පිළිබඳ දත්ත ඇතුලත් කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ.

මේ අතරතුර තත්‍ය කාලයෙහි ගාස්තු, කාමර ඉතිරිව ඇති ප්‍රමාණය සහ සීමා කිරීම් ස්වයංක්‍රීයවම PMS හරහා හෝටලයේ සිට විවිධ මාර්ගගත නාලිකා වලට යවනු ලැබේ.

හෝටල් ක්ෂේත්‍රයේ රැකියා වල නිරත වන්නන් හට දැන් අධික ලෙස වෙන් කිරීම් පිළිබඳ බියකින් තොරව කාමර වල උපරිම ඉන්වෙන්ට්‍රිය සහ ආදායම පවත්වාගෙන යා හැකිය. උදාහරණයක් ලෙස කාමර වෙන් කිරීමක් අවලංගු කරන අවස්ථාවේදී එම කාමරය ස්වයංක්‍රීයව සියළු නාලිකා ලබාගතහැකි (available) එක්වන අතර මිනිත්තු කිහිපයට පසු නැවත වෙන් කිරීමට හැකිවේ. ලිපිගොනු වලින් සැදුනු පද්ධතියක් භාවිතා කිරීමේදී මෙම කාමරය නැවත ලබාගත හැකි ලෙස සඳහන් කිරීම සිදුවනුයේ පසුවදාය.

මූලාශ්‍ර,

RevFine

Siteminder

Quora & Quora

සාරාංශය - **Summary**

- හෝටල් PMS එකක් මඟින් කඩදාසි හෝ excel පැතුරුම් පත් මත අපහසුවෙන් දිගු කාලයක් වැය කරමින් අතින් සිදු කරන ලද වෙන් කිරීම් ඇතුලත් කිරීම කාමර පිළිවෙල පවත්වාගෙන යාම ඉන්වොයිස් නිකුත් කිරීම යන කටයුතු පහසුවෙන් සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සපයයි.
- දේපල කළමණාකරණ පද්ධතියක් යනු නවාතැන් පහසුකම් සපයන ව්‍යාපාර වලට ඔවුන්ගේ එදිනෙදා කටයුතු කාර්යක්ෂමව කාල රාමුවකට අනුව සංවිධානය කර කළමණාකරණය කර ගැනීමට උපකාරී වන පරිගණක මෘදුකාංගයකි.
- PMS ඔබගේ වෙන් කිරීම් පද්ධතියත් OTA හරහා සහ අනෙකුත් නාලිකා හරහා පැමිණෙන වෙන් කිරීම් සහ මූල්‍යමය පද්ධතියත් යන සියල්ල සමඟ ඒකාබද්ධ වේ.

## **Hospitality Management Software - ආගන්තුක සත්කාර කළමණාකරන මෘදුකාංග**

මෙම පාඩම මාර්ගගත මෙවලම් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු පිළිබඳව දළ විශ්ලේෂණයක් සපයන අතර පාඩම අවසානයේදී ඔබට, මාර්ගගත මෙවලම් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු පිළිබඳව විස්තර කිරීමට හැකිවිය යුතුය.

ආගන්තුක සත්කාර කළමණාකරණ මෘදුකාංග යනු නවාතැන් පහසුකම් සපයන ව්‍යාපාර සඳහා අත්‍යවශ්‍ය මූල්‍යමය සහ ආයතනමය කාර්යයන් සිදු කරන මෙවලම් වේ.

මෙම කාර්යයන් අතරට වෙන් කිරීම්, සේවක කාල සටහන් සැකසීම්, ගිණුම්කරණය දේපල නඩත්තු කිරීම් කළමණාකරණය ඇතුලත් වේ. සාමාන්‍යයෙන් Cloud පදනම් කරගත් මෙම මෘදුකාංගයෙහි වෙන් කිරීම් පද්ධති (PMS) නාලිකා කළමණාකරුවන් ගිණුම්කරණය, විකුණුම් ලක්ෂය (POS) යන සියල්ල අන්තර්ගත වේ.

## **Choosing Accommodation Management Tools - නවාතැන් පහසුකම් කළමණාකරණය කරන මෙවලම් තෝරා ගැනීම.**

පෙර පාඨමාලා සහ පාඩම් වලදී අප විසින් මාර්ගගත සංචාරක ඒජන්තවරු (OTS's) වෙන් කිරීම් පද්ධති දේපල කළමණාකරණ පද්ධති (PMS) සහ මූල්‍යමය පද්ධති පිළිබඳව සාකච්ඡා කරන ලදී.

මේවායින් ඕනෑම එකක් ස්වාධීනව භාවිතා කළහැකි නමුත් බොහෝ අවස්ථා වල එක් එක් ඒවායේ ක්‍රියාකාරීත්වය අතර අතිච්ඡාදනයක් සිදුවේ.

උදාහරණයක් ලෙස බොහෝ නාලිකා කළමණාකරුවන් හා PMS එකට ක්‍රියා කරයි.

ඔබ විසින්, ඔබගේ ව්‍යාපාරික අවස්ථා වලට ගැලපෙන හොඳම විසඳුම් සපයා ගැනීමට අවශ්‍ය වන අතර ඔබට ඇත්තේ නවාතැන් පහසුකම් සපයන ව්‍යාපාරයක් නම්, ඔබට සුදුසුම

විකල්පය වන්නේ සියළුම කාර්යයන් සිදුකළ හැකි all in one හෝටල් කළමණාකරණ විසඳුමකි.

Credit :- Siteminder

පහත තොරතුරුමය දත්ත වඩාත් සුදුසු කළමණාකරණ විසඳුම තෝරා ගැනීමට මග පෙන්වයි.

Credit :- Hotelogix

මිල සංසන්දනය කරන විට පහත සඳහන් දේ පිළිබඳ අවධානය යොමු කරන්න.

- ක්‍රියාකාරීත්වය :- ඇතුලත් කර ඇති සියල්ල මොනවාද? උදාහරණයක් ලෙස ඔබගේ PMS හි නාලිකා කළමණාකරු හෝ මූල්‍යමය පද්ධතිය හෝ ඇතුලත්ද එසේත් නැතිනම් මෙම විශේෂාංග ඒකාබද්ධ කිරීමට අමතර ගෙවීමක් සිදුකළ යුතුද?
- මිල :- මාසය පුරා සමාන ගාස්තු ක්‍රමයක් පවතිනවාද එසේත් නැතිනම් එක් එක් වෙන් කිරීම සඳහා මුදල් අය කරන්නේද? මෙම ක්‍රම දෙක අතුරන් ඔබට වඩාත්ම ගැලපෙන ක්‍රමය කුමක්ද?
- කල් ඇතිව කැපවීම :- ඔබට තෝරා ගැනීම සඳහා බොහෝ කළමණාකරණ පද්ධති ප්‍රමාණයක් ඇති අතර ඉන් යම් ප්‍රමාණයක් මාසයක නොමිලයේ අත්හදා බැලීමේ කාලයක් ලබා දෙයි.

පිරිවැය පිළිබඳව සලකා බලන විට මෙම මෘදුකාංගය මඟින් ඔබට ඉතිරි කර දිය හැකි කාලය සහ පහසුව පිළිබඳව ද අවධානය යොමු කරන්න. බොහෝ අවස්ථා වලදී ඔබට ඔබගේ ජංගම දුරකතනය හරහා විමසීම් හා වෙන්කිරීම් කළමණාකරණය කළ හැකි නිසා ඔබට නිරන්තරයෙන් ඔබ වැඩකරන ස්ථානයට වී සිටීමට අවශ්‍ය නොවන අතර ඔබ කාර්යාලයෙන් පිටත සිටින විට වෙන් කිරීම් අහිමිවීමක් සිදු නොවේ.

"මකත තබා ගන්න,"

ඔබගේ කාලය = මුදල්

ඔබගේ ව්‍යාපාරයට අමතර සේවකයින් බඳවා ගැනීම වෙනුවට ඔබට මෙම මෘදුකාංගය මිලදී ගත හැක.

## Comparison Chart - සැසඳීමේ සටහන

ඔබට තෝරා ගැනීමට ඇති PMS සැපයුම්කරුවන් විශාල ප්‍රමාණයක් අතරින් ඉතා ජනප්‍රිය PMS සැපයුම්කරුවන් 04 දෙනෙකුගේ මිලගණන් ලක්ෂණවල වෙනස්කම් පිළිබඳව අදහසක් ලබා ගැනීම සඳහා පහත සැසඳීමේ සටහන වෙත යොමුවන්න.

• Hotelgix

• ezee Absolute

•Cloudbeds

• WebRezPro

## සාරාංශය - Summary

- සාමාන්‍යයෙන් cloud මත පදනම්ව ඇති ආගන්තුක සත්කාර කළමණාකරණ මෘදුකාංග වලට වෙන් කිරීම් පද්ධතියක්, දේපල කළමණාකරණ පද්ධතියක් (PMS) නාලිකා කළමණාකරුවන්, ගිණුම්කරණය විකුණුම් ලක්ෂ්‍යයන් යනාදී සියල්ල ඇතුලත් වේ.
- ඔබට නවාතැන් පහසුකම් සපයන ව්‍යාපාරයක් තිබේ නම් ඒ සඳහා වඩාත් සුදුසු වන්නේ සියළුම විසඳුම් එකම තැනකින් ලබා ගත හැකි All in one ආකාරයේ හෝටල් කළමණාකරණ විසඳුමකි.
- පිරිවැය පිළිබඳව සලකන විට එම මෘදුකාංගයෙන් ඔබට ඉතිරි කර දියහැකි කාලය සහ පහසුව පිළිබඳව ද සලකන්න.

# Online Accounting System - මාර්ගගත ගිණුම් පද්ධති

මෙම පාඩමෙන් ඔබට,

- Cloud පදනම් කරගත් ගිණුම්කරණය, බදු සහ ව්‍යාපාර සේවාවන්
- අතින් සිදුකරන ලද ගිණුම්කරණයට වඩා Cloud පදනම් කරගත් ගිණුම්කරණයේ වාසි.

  පිළිබඳ විශ්ලේෂණයක් ලබාදේ.

පාඩම අවසානයේදී ඔබට,

- පොත් තැබීමේ පද්ධතියක මූලික කරුණු අවබෝධ කර ගැනීම.
- මාර්ගගත ගිණුම්කරණ පද්ධතියක් භාවිතා කිරීමේ වාසි විස්තර කිරීම.
- ඔබගේ සංචාරක ව්‍යාපාරය සඳහා සුදුසු Cloud පදනම් කරගත් ගිණුම්කරණ පද්ධතියක් හඳුනාගැනීම.

  සිදු කළ හැකිවිය යුතුය.

ගිණුම්කරණ පද්ධතියක් යනු ව්‍යාපාරයක ආදායම් වියදම් සහ අනෙකුත් මූල්‍යමය ක්‍රියාකාරකම් කළමණාකරණය කිරීමට භාවිතා කරන පද්ධතියකි.

ගිණුම්කරණ පද්ධතියක් මඟින් ව්‍යාපාරයකට අදාල සියළුම මූල්‍යමය ගණුදෙනු නිරීක්ෂණය කරනු ලබයි. ඒ සඳහා මිලදී ගැනීම් (වියදම්) විකුණුම් (ඉන්වොයිසි හා ආදායම්) වගකීම් (අරමුදල් ගෙවිය යුතු ගිණුම්) ආදිය ඇතුලත් වන අතර ගිණුම්කරණ පද්ධතියකට තීරණ ගැනීමේදී උපකාරීවන සවිස්තරාත්මක සංඛ්‍යාත වාර්තා උත්පාදනය කිරීමේ හැකියාව ඇත.

අද වන වට විශේෂ මෘදුකාංග හෝ Cloud පදනම් කරගත් සේවා භාවිතයෙන් ගිණුම්කරණය බොහෝ දුරට ස්වයංක්‍රීය හා පරිගණකය පදනම් කරගත් ක්‍රියාවලියක් බවට පත් කර ඇත. කෙසේ නමුත් අතීතයේදී ගිණුම්කරණ පද්ධති අතින් ගණනය කිරීම් හා ශේෂය සෙවීම යන සංකීර්ණ ක්‍රියාවලි මාලාවක් විය.

## What an Accounting System Manages - ගිණුම්කරණ පද්ධති කළමණාකරණය කරනු ලබන්නේ මොනවාද?

### 01. Expenses – වියදම්

වෙනත් පුද්ගලයින් හෝ ආයතනයකින් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම් සඳහා ආයතනයෙන් එළියට ගලායන මුදල් "වියදම්" ලෙස හඳුන්වයි.

Excel වැනි අතින් දත්ත ඇතුලත් කිරීමේ පද්ධතියක් හෝ පැරණි ගිණුම්කරණ මෘදුකාංගයක් භාවිතා කරන විට එකින් එක වියදම් ඇතුලත් කිරීම්, ශේෂ කිරීම සහ වර්ග කිරීම සිදු කළ යුතු වේ. නමුත් ස්වයංක්‍රීය ගිණුම්කරණ පද්ධතියක් ඔබට ඉතා වේගයෙන් දත්ත ඇතුලත් කිරීමට වර්ගීකරණය සහ ස්වයංක්‍රීයව වියදම් ශේෂගත කිරීමට හැකියාව ලබාදේ.

### 02. Invoices - ඉන්වොයිසි

සුභවාදී වෙළඳ සන්නාම ප්‍රතිරූපයක් තුලින් පාරිභෝගිකයන්ගේ විශ්වාසය වැඩි කිරීම සඳහා වෘත්තීමය පෙනුමකින් යුත් ඉන්වොයිසියක් සැකසීම ප්‍රධාන අවශ්‍යතාවයක් වේ. ගිණුම්කරණ මෘදුකාංග මඟින් තමාට අවශ්‍ය පරිදි වෙනස් කිරීමටත් ගෙවන ලද ඉන්වොයිසි පිළිබඳ වාර්තා තබා ගැනීම සහ ආදායම් ගණනය කිරීමට හැකියාව ඇති පරිදි ක්ෂණිකව ඉන්වොයිසි සෑදීමට අවශ්‍ය පහසුකම් ලබා දෙනු ලැබේ.

### 03. Funding - අරමුදල්

ගෙවීමට ඇති ගිණුම් ව්‍යාපාරය සඳහා ලබාගෙන ඇති බැංකු ණය උකස් කිරීම් යනාදී සියළුම ව්‍යාපාරික වගකීම් මෙනමින් හඳුන්වයි.
ගිණුම්කරණ පද්ධතියක් මඟින් මේ සියළුම වගකීම් වල ගෙවිය යුතු වටිනාකම් වල වාර්තාවන් තබා ගන්නා අතර ගාස්තු ගෙවීමක් හෝ ගිණුම් පියවීමක් සිදුකළ වහාම මෙම දත්ත ස්වයංක්‍රීයව යාවත්කාලීන වේ.

## The difference between traditional & computerized accounting - සාම්ප්‍රධායික හා පරිගණක ගිණුම්කරණය අතර වෙනස

සාම්ප්‍රධායික ගිණුම්කරණයේ දී ගණුදෙනු සියල්ලම තීරු කඩදාසි වල අතින් ලියා ලිපිගොනු ගතකරන ලදී.

නමුත් වර්තමානයේදී පරිගණක ජනප්‍රිය වීමත් මෘදුකාංග පහසු මිලකින් යුතු වීමත් නිසා සියළුම ගිණුම්කරණ කටයුතු කඩදාසි වලින් මාර්ගගත ක්‍රමයට මාරු වී ඇත.

### Speed - වේගය

සාම්ප්‍රධායික හා පරිගණක ගතකරන ලද ගිණුම්කරණය අතර වඩාත් කැපී පෙනෙන වෙනස වන්නේ මෙහෙයුම් වල වේගයයි. ගිණුම්කරණ වැඩසටහනකදී දත්ත එක් වරක් ඇතුලත් කළ පසු ඒවා එහි සුරැකී පවතී. අතීතයේදී සිහිනයෙන් වත් නොපැතූ තරම් වේගයෙන් මෙම වැඩසටහන් වලට නැවත අදාල දත්ත ලබා දීමට හැකි වේ. ඔබගේ ව්‍යාපාරය ලාභ ලබාදෙනවාද නැතිද යන්න දැනගැනීම සඳහා තවදුරටත් දින/සති ගණනාවක් බලා සිටීමට අවශ්‍ය නොවේ. පරිගණක ගත ගිණුම්කරණය භාවිතයෙන් විනාඩි ගණනාවක් ඇතුලත අවශ්‍ය තොරතුරු ලබා ගතහැකි අතර පද්ධතියට තොරතුරු ඇතුලත් කළ වහාම එම වාර්තා විමසීම් හා විශ්ලේෂණ සඳහා ලබා ගතහැක.

### Accuracy - නිරවද්‍යභාවය

සාම්ප්‍රධායික අත්පොත් ක්‍රමයට සාපේක්ෂව පරිගණක ගත කරන ලද පද්ධති මගින් සිදුකරන ගණනය කිරීම් වල නිරවද්‍යතාවය ඉතාමත් වැඩි වේ. සාම්ප්‍රධායික ක්‍රමයේදී තීරු එකතු කිරීමද, ඉලක්කම් එක් පිටුවකින් අනෙක් පිටුවට මාරු කිරීමට, ශේෂය අත්හදා බැලීම් හා මූල්‍ය ප්‍රකාශන අතින් සකස් කළ යුතු අතර යම් වරදක් සිදු වුවහොත් එය නිවැරදි කිරීමට පැය ගණනාවක් වැය කිරීමට සිදු වේ. ගිණුම්කරණ මෘදුකාංගයක් භාවිතා කිරීම මගින් මෙම ගැටළුව මගහරවා ගත හැක.

**Costs - පිරිවැය**

කඩදාසි හා පෑන් උපයෝගී කරගනිමින් අතින් සිදු කරන සාම්ප්‍රධායික ගිණුම්කරණ පද්ධතිය පරිගණක ගත ක්‍රමයට වඩා ලාභදායී වේ. කුඩා ව්‍යාපාර සඳහා යම් කිසි සීමාවකට පැමිණෙන තුරු මැනුවල් පද්ධතියක් ප්‍රමාණවත් නමුදු දැරිය හැකි මිලකට පරිගණක හා මෘදුකාංග මිලදී ගෙන පරිගණකගත පද්ධති භාවිතා කිරීම බොහෝමයක් ව්‍යාපාර විසින් සිදු කරයි.

**Backups උපස්ථ (පිටපත් තබා ගැනීම්)**

මැනුවල් පද්ධතියක් භාවිතා කරන විට දත්ත නැතිවීමේ ප්‍රවණතාවය ඉතාමත් ඉහලය. වැදගත් ලිපි ද්‍රව්‍ය වලට හානි වූ හෝ සම්පූර්ණයෙන්ම විනාශ වූ අවස්ථා වලදී ඒ සියල්ල නැවත සකස් කිරීමට සිදුවනු ඇත. මුල් ලිපිද්‍රව්‍ය වල පිටපත් සකස් කළ හැකි නමුත් එය මිල අධික සහ කාලය වැඩියෙන් වැයවන ක්‍රමයකි.

Xero’s dashboard display

Credit :- Beanninjas

## Advantages of cloud based accounting - වළාකුළු පදනම් කරගත් ගිණුම්කරණයේ වාසි

- භාවිතයෙහි පහසුව :- ඉතා අඩු ගිණුම්කරණ දැනුමක් ඇති කුඩා ව්‍යාපාර හිමියෙකුට වුවද ව්‍යාපාරයෙහි මූල්‍යමය කටයුතු පහසුවෙන් කර ගැනීමට අවස්ථාව මාර්ගගත ගිණුම්කරණයෙහි ඇති පරිශීලක මිත්‍රශීලී ස්වභාවය නිසා හිමි වී ඇත.
- ගබඩා කිරීම සහ වේගය :- වලාකුළු මෘදුකාංගයේ දුරස්ථ ගබඩා කිරීමේ හැකියාව සහ සැකසීමේ හැකියාවන් භාවිතා කිරීමෙන් සමාගමේ පරිගණක වල එදිනෙදා තොරතුරු තැන්පත් කිරීමෙන් වැලකී සිටිය හැකි අතර එමඟින් දෘඩතැටි වල ඇති ඉඩකඩ ඉතිරි කර ගැනීමටත් පරිගණකය ක්‍රියාත්මක කිරීමේ වේගය මනාව පවත්වා ගැනීමත් කළ හැකිය.

- ආරක්ෂාව :-වලාකුළු ගිණුම්කරණ සේවා සපයන්නන් යනු පාරිභෝගික දත්ත ආරක්ෂා කිරීම සිදුකරන්නන්ය. මෙම සේවා සපයන්නන් දත්තවල අඛණ්ඩතාවය සහ දත්ත යන දෙකම ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂිත පියවර රාශියක් ගෙන ඇත. සාමාන්‍ය ගිණුම්කරණ පද්ධතියක් භාවිතා කරන සමාගම් වලට දත්ත නැතිවීමේ අවදානම්, අනන්‍යතා හොරකම්, බුද්ධිමය දේපල හොරකම් පරිගණක වෛරස වැනි වෙනත් ආරක්ෂක ගැටළු වලට මුහුණ දීමට සිදුවීමේ අවදානම ඇත.
- නම්‍යශීලීතාවය :- බොහෝ සම්මත දේශීය මෘදුකාංග වැඩසටහන් වලට වඩා නම්‍යශීලී බවක් ලබාදෙන වලාකුළු ගිණුම්කරණ වැඩසටහන් භාවිතා කරන්නන්ට විවිධ උපාංග වලින් ගිණුම් වාර්තා වලට පිවිසීමට හා විශ්ලේෂණය කිරීමට හැකියාව ලැබේ.
- විශ්වාසනීයත්වය :- දේශීය සේවාදායකයන් (local servers) බිඳවැටුනු අවස්ථා වලදී ඒ හරහා ආයතනයක මූල්‍යමය වාර්තා වලට පිවිසීම තාවකාලිකව අවහිර වීමට ඉඩ ඇත. නමුත් වලාකුළු පද්ධතියක් භාවිතා කරන්නන්ට ඕනෑම අවස්ථාවක ඕනෑම ස්ථානයක සිට මූල්‍යමය වාර්තා වලට පිවිසීමට අවශ්‍ය වන්නේ අන්තර්ජාල සම්බන්ධතාවක් පමණි.
- බදු :-වලාකුළු පදනම් කරගත් පද්ධතියක් භාවිතා කරන විට මව්සයට තට්ටු කිරීම් කිහිපයක් (a few mouse clicks) මඟින් ඔබට අවශ්‍ය කරන සියලුම බදු පිළිබඳ දත්ත සහ මූල්‍ය වාර්තා වලට පිවිසිය හැක.

## ජනප්‍රියම ගිණුම්කරණ මෘදුකාංග

වඩාත්ම ජනප්‍රිය ගිණුම්කරණ පද්ධති වලින් කිහිපයක් වන්නේ,

Quick Books

Quicken

Xero

Myob

මෙම වැඩසටහන් ඒවායේ ලක්ෂණ මිලගණන් හා භාවිත කිරීමේ පහසුව මත වෙනස් වේ.

ඔබ ගිණුම්ගත වැඩසටහනක් තෝරා ගැනීමට සූදානම් වූ විට මෙම මෙවලම් සංසංදනය කරන පහත ලිපිනයට පිවිසෙන්න.

## The best small business accounting tools - කුඩා ව්‍යාපාර සඳහා හොඳම ගිණුම්කරණ මෙවලම්


මූලාශ්‍ර :-

http://www.paychex.com/articles/finance/what-is-cloud-accounting

http://www.smallbusiness.chron.com/difference-between-traditional-accounting-computerized-accounting-4021.html


### සාරාංශය - Summary

- ව්‍යාපාරයක ආදායම්, වියදම් සහ අනෙකුත් මූල්‍යමය ක්‍රියාකාරකම් කළමණාකරණය කිරීමට ගිණුම්කරණ පද්ධතියක් භාවිතා කරනු ලැබේ.
- සාම්ප්‍රධායික ලෙජර් පොත් වලට වඩා මාර්ගගත ගිණුම්කරණ පද්ධති වේගවත් වඩාත් නිවැරදි, ආරක්ෂිත හා විශ්වාසනීය වේ.